*සැ. යු.* 2008.08.22 දින පළවූ *ගැසට් පත්‍රයේ* I/II (අ) කොටසේ ගැසට් පත්‍ර අංකය 1563 නොව 1564 වශයෙන් නිවැරදි විය යුතුය.
2008.09.19 දින පළ කරන ලද අංක 1,568 *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,569 - 2008 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2008.09.26**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1194 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1195 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ඔක්තෝබර් මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 සැප්තැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1191 - B 079942 — 9,160 (2008/09)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ අසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයැදුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම

මවිසින් පළ කරන ලද පහත සඳහන් කොට්ඨාශයේ උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීම මෙයින් අවලංගු කරමි.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාශය හා තනතුර* | *ගැසට් පත්‍රයේ දිනය හා අංකය* |
|---|---|---|---|
| අනුරාධපුරය | පලාගල | බටහිර කිරලව කෝරළේ උප්පැන්න හා මරණ සහ කලාගම් පළාත විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | 2008 අගෝස්තු මස 29 වැනි දින අංක 1,565 දරන ගැසට් පත්‍රය |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

09-989

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 ඔක්තෝබර් මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 සැප්තැම්බර් මස 3 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදීය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| 01. කොළඹ | තිඹිරිගස්යාය | කොල්ලුපිටිය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12. |
| 02. කොළඹ | රත්මලාන | රත්මලාන, ගල්කිස්ස කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ලවීදිය, කොළඹ 12. |
| 03 කොළඹ | හංවැල්ල | අවිස්සාවේල්ල නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ලවීදිය, කොළඹ 12. |
| 04. කොළඹ | කොළඹ | මෝදර උතුරු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ලවීදිය, කොළඹ 12. |
| 05. කොළඹ | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | කොළඹ කොට්ඨාසයේ කෝට්ටේ දකුණ ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ලවීදිය, කොළඹ 12. |

09-856

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය**

වෘත්තීය සංවර්ධනය සඳහා මග

**උසස් තාක්‍ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2009 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන මෙහි පහත දැක්වෙන උසස් ජාතික ඩිප්ලෝමා හා ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2007 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල පැරණි හා නව නිර්දේශය යටතේ අ.පො.ස. (උ.පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්පත් :*

ආදර්ශ අයදුම්පත පහත දක්වා ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම්පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රු. 250 ක මුදලක් කොළඹ මහජන බැංකු උද්‍යාන වීදියේ ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 0025-100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන ජංගම ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත "අ" කොටසේ සඳහන් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම්කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම් අයදුම්කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රු. 250 ක වටිනාකමින් යුත් කුවිතාන්සි සමගින් අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"අ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරා ගත යුත්තේ "ආ" කොටසෙහි සඳහා පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණ කාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද අර්ධ කාලීන පාඨමාලා සඳහා දේශන සති අන්ත දිවා කාලයේ ද පැවැත්වේ. අර්ධ කාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

දිවා පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධ කාලීන ඉංග්‍රීසි පාඨමාලාව සඳහා සෑම සමාසිකයකටම රු. 2,000 බැගින් අයකරනු ලැබේ. උසස් ජාතික ගණකාධිකරණ පාඨමාලාවේ 1 වැනි හා දෙවන වසර සඳහා රු. 2,000 ක් ද තෙවන හා සිව්වන වසර සඳහා රු. 3,000 ක් ද සෑම සමාසිකයකටම අයකරනු ලැබේ. (වසරකට සමාසික දෙකකි) මෙම ගාස්තු වාර්ෂිකව සංශෝධනයකට යටත්වේ.

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝගතා පරීක්ෂණයට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. ශිෂ්‍යයන් තෝරාගැනීම මූලිකව උසස් පෙළ විභාගයේදී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. **මුල් සහතික නොමැති අවස්ථාවලදී ලියාපදිංචියේදී එවා ඉදිරිපත් කිරීමේ එකඟතාවය මත පමණක් සහතික කළ ඡායාපිටපත් භාරගනු ලැබේ.**

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් හා අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ ද සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම් ලත් සිසුන්ගේ ස්ථිර පදිංචියේ දුරස්ථභාවය අනුව පමණි.

“ අ ” කොටස

**උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ඒවායේ සංකේත අංක , ලිපිනයන් හා දුරකථන අංක :**

| ආයතන අංකය | ආයතන | ලිපිනයන් | දුරකථන අංක |
|---|---|---|---|
| 01. | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල. | වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 |
| 02. | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල | කළුවැල්ල, ගාල්ල | 091-2223774 |
| 03. | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර | අංක 16,කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644 |
| 04. | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911 |
| 05. | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව් , බදුල්ල | 055-2230218 |
| 06. | උසස් තාක්ෂණ ආයතනය, යාපනය | අංක 665/5, වෙරළ පාර, යාපනය | 021-2222595 |
| 07. | උසස් තාක්ෂණ ආයතනය, නයිවල | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2292544 |
| 08. | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | ඉගිනියාගල පාර, අම්පාර | 063-2222056 |
| 09. | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නියපාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය | 026-2223232 |
| 10. | උසස් තාක්ෂණ ආයතන අංශය, ලබුදූව | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2227880 |
| 11.* | උසස් තාක්ෂණ ආයතන අංශය, වරකාපොළ | කාර්මික විදුහල, අඹගල පාර, වරකාපොළ | 035-2267735 |
| 12. | උසස් තාක්ෂණ ආයතන අංශය, අනුරාධපුරය | කාර්මික විදුහල, නව නගරය, අනුරාධපුරය | 025-2234417 |
| 13.* | උසස් තාක්ෂණ ආයතන අංශය, රත්නපුරය | කාර්මික විදුහල, කොළඹ පාර, රත්නපුරය | 045-5677758 |
| 14. | උසස් තාක්ෂණ ආයතන අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 |
| 15. | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව | කාර්මික විදුහල, මාන්වන්තුඩුවෙයි, මඩකලපුව | 065-2247519 |

* වරකාපොල උසස් තාක්ෂණ ආයතන අංශය 2009 ජනවාරි මාසයේදී කෑගල්ල උසස් තාක්ෂණ ආයතනයට ගෙන යනු ලැබේ.

* රත්නපුරය, උසස් තාක්ෂණ ආයතන අංශයේ ලිපිනය 2009 ජනවාරි මාසයේදී වෙනස්විය හැකිය.

**පාඨමාලා හා ඒවා පැවැත්වෙන ආයතන, සහ ආයතන අංශ :**

| | පාඨමාලාව | කාලය වසර | පාඨමාලා පැවැත්වෙන ආයතනයන්හි සංකේත අංක |
|---|---|---|---|
| 1. | උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (උ.ජා.ග.ඩි) - දිවා/පූර්ණ කාලීන | 4 | 1,2,3,4,5,6,9,11,12,14,15 |
| 1.1 | උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - සතිඅන්ත/අර්ධ කාලීන | 4 | 1,2,3,4,5,6,9,11,12,13,14,15, |
| 2. | උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (උ.ජා.ක.ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 1,2,3,4,5,6 |
| 3. | උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (උ.ජා.තො. තා.ඩි.) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 2 1/2 | 3,4,5,6,7,8,9,10,11 |

| | පාඨමාලාව | කාලය වසර | පාඨමාලා පැවැත්වෙන ආයතනයන්හි සංකේත අංක |
|---|---|---|---|
| 4. | උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා - කෘෂිකර්මය (උ.ජා.තා.ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 7,8,10 |
| 5. | උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ.ජා.ඩි.- ඉංග්‍රීසි) දිවා/පූර්ණ කාලීන | 2 | 1,2,3,4,5,6,8 |
| | උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ.ජා.ඩි-ඉංග්‍රීසි) සතිඅන්ත/අර්ධ කාලීන | 2 | 1,2,3,4,5,6,8,9,11,12,14,15 |
| 6. | උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමා (උ.ජා.ව්‍යා.අ.ඩි.) - දිවා /පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 3 | 1,2,3,5,6 |
| 7. | ව්‍යාපාර මූල්‍ය ජාතික ඩිප්ලෝමා (ව්‍යා.මූ.ජා.ඩි.) - දිවා/පූර්ණ කාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 2 | 1 |

*සැලකිය යුතුයි* :

1. සියලුම පාඨමාලාවලට අදාළ විෂය නිර්දේශ සංශෝධනයට යටත්ව ඇති අතර, 2008 වර්ෂයේදී ඇතැම් පාඨමාලා සංශෝධිත විෂය නිර්දේශයට අනුව ක්‍රියාත්මක වන අතර, එහිදී පාඨමාලා කාලය වෙනස් විය හැකිය.
2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන) පාඨමාලාව පළමු සහ දෙවන වසර සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර ඉංග්‍රීසි මාධ්‍යයෙන් සති අන්තයේ ද දේශන පවත්වනු ලැබේ.
3. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණ කාලීන) පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී දේශන පවත්වනු ලබන අතර තෙවන වසර සඳහා දේශන පවත්වනු ලබන්නේ සති අන්තයේ දී ය.
4. අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.
5. ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේදී අ.පො.ස. (උ.පෙ) ඒකාබද්ධ ලකුණු හෝ Z-Score සැලකිල්ලට ගනු ලැබේ.
6. සුදුසුකම් ලද විභාගයේදී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. දිවා/පූර්ණ කාලීන පාඨමාලාව සඳහා වයස අවු. 22ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

   ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක /අනුබද්ධිත විශ්ව විද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක, අධ්‍යාපන විද්‍යා පීඨයක /ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ දිවා/පූර්ණ කාලීන පාඨමාලාවන් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයෙකු පාඨමාලාව හදාරන එකම කාලය තුළදී වෙනත් ඉහත දැක්වූ රජයේ ආයතනයක පූර්ණ කාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවන් හදාරන බව හෙළිදරවු වුවහොත් ඔවුන්ගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බවද සැලකිය යුතුය. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ලියාපදිංචි සිසුන් සඳහා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක ලියාපදිංචිය අහිමි බවද සැලකිය යුතුය.

8. කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්ෂණ ආයතනයකට හෝ ආයතන අංශයකට මාරු කරනු නොලැබේ.

**ආ කොටස**

පාඨමාලාවලට ඇතුළත් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දැක්වේ:-

01. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් :-

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණය විෂයය ඇතුළත්ව විෂයයන් හතරෙන්ම සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් දෙකකට එම අවස්ථාවේම හෝ වෙනත් අවස්ථාවකදී හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණ විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

*හෝ*

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය ඇතුළුව විෂයයන් තුනෙන්ම සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතුය. සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පය ජාතික සහතිකය සමත්වීම.

*සහ*

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරෙන් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනෙන් ලබාගත් ඉහළම ලකුණු තෝරා ගැනීමේ පදනම වේ.

1.1 උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන)

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් :-

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ අන්තර් මාධ්‍ය පරීක්‍ෂණය හෝ සමත්වීම;
(ii) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් අවස්ථාවකදී විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ එක් අවස්ථාවකදී විෂයයන් තුනකින් සාමාර්ථයක් ලබා තිබීම,
(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම,
(iv) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම.

*සැ. යු. (අ)* *ප්‍රායෝගික පළපුරුද්ද* - අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතුය.

*(ආ)* පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි 11 වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ව්‍යාපාර අධ්‍යයන/මූල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
(ii) උසස් ජාතික වාණිජ/කළමනාකරණ ඩිප්ලෝමා හෝ එහි II වසර පරීක්ෂණය
(iii) විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය
(iv) වාණිජවේදී උපාධිය
(v) විද්‍යාවේදී (ගණකාධිකරණය) උපාධිය
(vi) ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේ I සහ II පරීක්‍ෂණය
(vii) වරළත් කළමණාකාරිත්ව හා ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්‍ෂණය
(viii) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්‍ෂණය

**02. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් හතරකින් සමත්වීම හෝ නව නිර්දේශය යටතේ එකවරකදී විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම,

සහ

අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**03. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් :-

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, ශුද්ධ ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම.

*හෝ*

(ii) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම.

*හෝ*

(iii) අ.පො.ස. (උ.පෙළ,) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම.

*හෝ*

(iv) අ.පො.ස. (උ.පෙළ,) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව , ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම.

සහ

(v) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.
කෘෂි විද්‍යාව අ.පො.ස. (උ.පෙ.) 1995 සිට ක්‍රියාත්මක වන නව විෂයය නිර්දේශය වේ.

**04. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) (දිවා/පූර්ණ කාලීන)**

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම.

හෝ

(ii) එක් වතාවකදී අ.පො.ස. (සා.පෙ.) නව නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම.

සහ

(iii) අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - (පූර්ණ කාලීන/අර්ධ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය.

(i) ඉංග්‍රීසි විෂයය ඇතුළුව අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනකින් සාමාර්ථය.
(ii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමාර්ථය (සී).
(iii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා විශිෂ්ඨ සාමාර්ථය (ඒ හෝ බී).
(iv) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි).
(v) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී විෂයයන් තුනකින් සාමාර්ථය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය.

**06. උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය.

(i) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මුල්‍ය සහ ගණකාධිකරණ යන විෂයයන් තුනෙන් අ.පො.ස. (උ.පෙ.) සාමාර්ථයක් හෝ ඉහත සඳහන් විෂයයන් දෙකකින් සහ ශුද්ධ ගණිතය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, දෙමළ, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය හෝ ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරෙන් එක් විෂයයක් ද සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් එක්වරකදී සාමාර්ථය ලබා තිබීම.

හෝ

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම.

සහ

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. ව්‍යාපාර හා මුල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් තිබිය යුතුය.

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මුල්‍ය ගණකාධිකරණය ඇතුළු විෂයයන් හතරකින් එක් වරකදී සමත්වී තිබීම.

හෝ

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක් වරකදී විෂයයන් තුනකින් සමත්ව තිබීම.

සහ

(iii) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සටහන :-

1. යාපනය, ත්‍රිකුණාමලය, සමන්තුරේ, මඩකලපුව හා දෙහිවල යන ආයතනයන්හි පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. ත්‍රිකුණාමලය, උසස් තාක්ෂණ ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් ද පැවැත්වේ.

2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය 1990 ඔක්තෝබර් මස 30 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 අනුව පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ විද්‍යාවේදී උපාධිය සාමාන්‍ය සමාර්ථයට සමානව පිළිගෙන ඇත.

3. දෙහිවල හා මහනුවර උසස් තාක්ෂණ ආයතනවල උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

4. ඔබගේ සුදුසුකම්වලට අනුව ඔබ ප්‍රවේශය සඳහා සලකා බැලීමට කැමති පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2009 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2008 ඔක්තෝබර් මස 17 වේ.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

Web site : www.sliate.net

Office use only – Course Number ..........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA/NATIONAL DIPLOMA COURSE***

Name of the Institute/Institute Section :————————————————————.

| *Name of the Course* | *Order of Preference* | *Medium* |
|---|---|---|
| 1. ............................ | .......................................... | ............................... |
| 2. ............................ | .......................................... | ............................... |
| 3. ............................ | .......................................... | ............................... |

1. Name with initials :————————————————————————.
2. Name/Names denoted by Initials :——————————————————.
:————————————————————————————.
3. Address ::——————————————————————————.
:————————————————————————————.
4. Date of Birth :
Year :—————. Month:—————. Date:—————.
Age (as at 01.01.2009) :
Years:—————. Months :—————. Days:—————.

5. National Identity Card No. :———————————————————.

6. Sex :————————————————.
Male/Female

7. Administrative District :—————————————————————.

8. (i) Results of GCE (A/L) Examination ( in or Before 2007)
Year :—————. Index No.:—————. Medium:—————.

| *Pass Subjects* | *Grade* |
|---|---|
| 1. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... |

If under new syllabus indicate pass or fail in the general paper :—————

Aggregate/Average marks or Z-score of the above examination, issued by the Department of Examination :—————

(ii) Result of GCE (O/L) Examination :—————

Year : ..................................... Index No.:..................................... Medium :...............

| *Subject* | *Grade* | *Subject* | *Grade* |
|---|---|---|---|
| 1. ..................................... | ..................................... | 6. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... | 7. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... | 8. ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... | 9. ..................................... | ..................................... |
| 5. ..................................... | ..................................... | 10. ..................................... | ..................................... |

9. Highest Qualification in English as a subject :——————————————————.

10. Details of Occupation :—————. Date of Appointment:—————.
(only for part-time/weekend courses)

Post :————————————————.
E. P. F. Number :————————————————.
Place of Work and Address :————————————————.

I hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full-time course at any other state institution. I hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————————.
Signature of Applicant.

Date :——————.

(The Bank receipt for Rs. 250 payable to SLIATE should be annexed).

**විදේශීය ආධාර යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්**

| *සුනාමි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය කුවේට් (2006-2009)* | *ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය (2008-2011)* | *අර්ක් ව්‍යාපෘතිය (ලෝක බැංකු) (2008-2009)* |
|---|---|---|
| ***යටිතල පහසුකම් සංවර්ධනය***<br>1. තෙමහල් ගොඩනැගිලි දෙකක් උසස් තාක්ෂණ ආයතනය, යාපනය<br>2. තෙමහල් ගොඩනැගිලි දෙකක් උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | ***ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ වන සේවාවන් :-***<br>1. නව විෂය මාලා හඳුන්වාදීම, මෘදුකාංග ඉංජිනේරු ශිල්පය,ආහාර තාක්ෂණය, විදුලි සංදේශ ශිල්පය,විසිතුරු මසුන් වගාව, උද්‍යාන විද්‍යාව | 1. ***ආර්ථික සංවර්ධනයට ගැලපෙන අන්දමට දැනට පවත්නා ඩිප්ලෝමා පාඨමාලා යාවත්කාලීන කිරීම,***<br>[HNDA, HNDM, HND in English, HNDIT, HNDT (Agri), HNDBS, NDBF පාඨමාලා] |

| *සුනාමි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය කුවේට් (2006-2009)* | *ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය (2008-2011)* | *අර්ක් ව්‍යාපෘතිය (ලෝක බැංකු) (2008-2009)* |
|---|---|---|
| 3. නිල නිවාස උසස් තාක්ෂණ ආයතනය, ලබුදූව | 2. සියලුම උසස් තාක්ෂණ ආයතන සඳහා භාෂා හා පරිඝනක දැනුම වර්ධනය කිරීම සඳහා විද්‍යාගාර 02 බැගින් | 2. ඉහත සඳහන් අධ්‍යයන වැඩසටහන් සඳහා නව ඇගයීම් ක්‍රම |
| 4. සිව් මහල් අධ්‍යයන ගොඩනැගිල්ල සහ නිල නිවාස, හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | | 3. ශ්‍රී. ලං. උ. තා. අ. ආ. යේ සිසුන්ගේ හැකියා වර්ධනය සඳහා සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම |
| 5. සිව් මහල් ගොඩනැගිල්ල, උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල, ලබුදූව | 3. සියලුම උසස් තාක්ෂණ ආයතනය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් | 4. සියලුම උසස් තාක්ෂණ ආයතනයන් සඳහා අංග සම්පූර්ණ ශ්‍රව්‍ය දෘෂ්‍ය පංති කාමරයක් බැගින් පිහිටුවීම |
| 6. අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනය හා ලබුදූව උසස් තාක්ෂණ ආයතනය සඳහා කෘෂිකර්ම මෙවලම් සහ යන්ත්‍රෝපකරණ | 4. අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල වල හැකියා හා කුසලතා සංවර්ධනය | 5. අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල හැකියා හා කුසලතා සංවර්ධනය |

* HNDA - පරිඝනක පාදක ගිණුම්කරණ පද්ධති විශේෂයෙන් හඳුන්වා දී ඇත. (සතියේ දිනවල සහ සති අන්තවල දී)
* HNDM - අලෙවිකරණය සහ මානව සම්පත් සංවර්ධන අංශ ඇතුලත් නව විකල්ප හඳුන්වා දී ඇත.
* HNDIT - කාර්මික ක්ෂේත්‍රයේ ඉල්ලුමට සරිලන පරිදි නව විෂයයන් හඳුන්වා දී ඇත.

**දකුණු ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලය මගින් ලබාදී ඇති නිදහස් කිරීම්**

දකුණු ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලය මගින් පැවැත්වෙන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව HNDA, HNDM (SLIATE) ඩිප්ලෝමාධාරීන්ට පහත දැක්වෙන ආකාරයේ නිදහස් කිරීම් ප්‍රදානය කෙරේ :

1. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (අවුරුදු 1 1/2);
2. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (අවුරුදු 1).

09-1098

---

**සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් සහ ව්‍යාපෘති නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008**

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් සඳහා දොළොස් වන වැටුප් පියවරට එළඹීමට පෙර හා ව්‍යාපෘති නිලධාරීන් සඳහා හත්වන වැටුප් පියවරට එළඹීමට පෙර සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2008 දෙසැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාග සඳහා අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2008 ඔක්තෝබර් 28 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය.-* මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

(i) ආර්ථික සංවර්ධනය/ක්‍රම සම්පාදනය (කාලය පැය 03යි) - ලකුණු 100යි- විෂය අංකය -1

(ii) සමාජ විද්‍යාව/ප්‍රාදේශීය සංවර්ධනය (කාලය පැය 02යි) - ලකුණු 100 යි - විෂය අංක. -2

*සටහන :-*

(*අ*) ඉහත විෂයයන් දෙක සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.

(*ආ*) සාමාර්ථ්‍යය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුයි.

(*ඇ*) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

03. *විෂයයන් :-*

(*අ*) ආර්ථික සංවර්ධනය/ක්‍රම සම්පාදනය (කාලය පැය 03 යි):-

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය, ප්‍රතිපත්ති හා ගැටලු;

(ii) ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම;

(iii) දත්ත එක්රැස් කිරීම, ගොනු කිරීම හා විශ්ලේෂණය පිළිබඳ සාමාන්‍ය දැනුම.

(*ආ*) සමාජ විද්‍යාව/ප්‍රාදේශීය සංවර්ධනය (කාලය පැය 02 යි):-

(i) ග්‍රාමීය සමාජ විද්‍යාව;

(ii) ශ්‍රී ලංකාවේ ගැමි සමාජය;

(iii) ශ්‍රී ලංකාවේ නාගරීකරණය;

(iv) ප්‍රාදේශීය සංවර්ධනය.

04. සුදුසුකම්:- සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සියලු සංවර්ධන නිලධාරී හා ව්‍යාපෘති නිලධාරී තනතුරු දරන නිලධාරීන් මේ සඳහා සුදුසුකම් ලබයි.

05. *අයදුම් කළ යුතු පිළිවෙල* :

*(අ)* මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය. 01 සිට 07 තෙක් කොටස් 1 වන පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ ද පිළියෙල කරගත යුතුය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව හා සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ඉදිරිපත් කළ යුතු අතර එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. (මෙම අයදුම්පත්‍රයේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

*(ආ)* අයදුම්පත්‍ර තමා සේවය කරන කාර්යාලයේ ප්‍රධානියා මගින් 2008 ඔක්තෝබර් 28 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

*(ඇ)* අයදුම්පත්‍ර සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

*(ඈ)* අදාල ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ, එමෙන්ම ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. ඉල්ලුම්පත්‍ර තැපෑලේදී නැතිවීම නිසා හා ප්‍රමාදවීම පිළිබඳව කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

06. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද, ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් කෙරේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය:

(i) විභාගයේ නම ;

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම ;

(iii) සම්පූර්ණ ලිපිනය ;

(iv) අයදුම්පතේ ඡායා පිටපතක් ;

(v) මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ;

(vi) ලියාපදිංචි කළ තැපැල් කාර්යාලයේ නම, අංකය හා දිනය.

07. *අනන්‍යතාව* :

අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු හැඳුනුම්පත්‍රය;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල් ට බලය ඇත.

08. *විභාග ගාස්තු* .- මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත පදනම මත ගාස්තු අය කෙරේ :

| | | |
|---|---|---|
| *(අ)* | පළමු වතාව සඳහා | ගාස්තු අය නොකෙරේ |
| *(ආ)* | පළමු වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | රු. 200.00 |
| *(ඇ)* | එක් විෂයයක් සඳහා | රු. 100 යි |

* විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂයට බැර වනසේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් කුවිතාන්සියක් නොගැලවෙන සේ අයදුම්පතේ අලවා එවිය යුතුය. ( මෙම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත්කර ඇති තමන්ගේ ආයතනවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

10. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මෙම අමාත්‍යාංශයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියාකරනු ලැබේ.

ධාරා විජයතිලක,
සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා )

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ බඳවාගත් සංවර්ධන නිලධාරීන් සහ ව්‍යාපෘති නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008

**SECOND EFFICIENCY BAR EXAMINATION FOR DEVELOPMENT OFFICERS AND PROJECT OFFICERS RECRUITED UNDER THE MINISTRY OF PLAN IMPLEMENTATION - 2008**

*සැළකිය යුතුයි .-* මෙම ආකෘති පත්‍රය නිවැරදිව හා පැහැදිළිව අපේක්ෂකයාගේ /අපේක්ෂිකාවගේ අත් අකුරින් ම සම්පූර්ණ කළ යුතුයි.

*විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*
සිංහල : 2
දෙමළ : 3
ඉංග්‍රිසි : 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) මුලකුර අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ):——————. *උදා :* SILVA, B.A.

(ii) අගට යෙදෙන නම මුලකුරු සමග : (සිංහලෙන් /දෙමළෙන් ):——————.

(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම : (සිංහලෙන් /දෙමළෙන් ) :——————.

(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :——————.

02. (i) කාර්යාලයීය ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්):——————.
(ii) කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ඇත.):——————.

03. *උපන් දිනය :*

අවුරුද්ද: | | | | | මාසය: | | | දිනය: | | |

04. සංවර්ධන නිලධාරී /ව්‍යාපෘති නිලධාරී තනතුරෙහි වැඩ භාරගත් දිනය (නිත්‍ය වශයෙන්ම රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතුයි.)

අවුරුද්ද : | | | | | මාසය: | | | දිනය : | | |

05. *ගැසට් නිවේදනයේ* 2 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් :

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| .......................... | |
| .......................... | |

06. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :——————.
07. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :——————.

විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂයට බැරවනසේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් කුවිතාන්සියක් නොගැලවෙන සේ මෙම කොටුවේ ඇලවිය යුතුයි.( මෙම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ).

08. මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර නිවැරදි බව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති පිළිපැදීමට ද මම පොරොන්දු වෙමි. ඉදිරිපත් වී ඇති භාෂා මාධයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ප්‍රකාශ කරමි.

——————.
අපේක්ෂකයාගේ /අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :——————.

*සටහන :*

තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකුගේ හෝ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතුයි.

09. *අත්සන සහතික කිරීම :*

මගේ කාර්යාලයේ නිලධාරියකු / නිලධාරිනියක වූ, මා පෞද්ගලික ව හඳුනන ................. මහතා /මහත්මිය/ මෙනවිය .............. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

——————.
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි)

නම :——————.

පදවි නාමය :——————.

ලිපිනය :——————.

10. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා / අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

නම :——————.

පදවි නාමය :——————.

දිනය :——————.

09 - 896

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව**

***අධුනිකයන් බඳවා ගැනීම - 2009 ජනවාරි***

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන ආධුනිකත්ව අභ්‍යාස ආයතනය සහ එහි අනුබද්ධිත ආයතන (Holcim - ATI EVE Centre) දඹුල්ල ශ්‍රී සුමංගල NAITA මුද්‍රණ පාසල) පහත දැක්වෙන පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :

| | *පාඨමාලාවේ නම* | *(නිපුණතා පාදක පුහුණුව)* | *කාලය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | කම්බි නැවුම් ශිල්පී | 3 වැනි මට්ටම | මාස 6 | 8 වැනි ශ්‍රේණිය සමත් |
| 02. | ගොඩනැගිලි පින්තාරු ශිල්පී | - | අවු. 1 | |
| 03. | පෙදරේරු කාර්මික ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 2 | |
| 04. | ජලනල කාර්මික ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 2 | |
| 05. | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | - <br> 4 වැනි මට්ටම | අවු. 2 | |
| 06. | මූලික පොත් බඳින්නා (දඹුල්ල ශ්‍රී සමුංගල NAITA මුද්‍රණ පාසල සඳහා පමණි) | - | අවු. 1 | |
| 07. | ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී | 3 වැනි මට්ටම | අවු. 2 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව ඇතුලුව විෂයයන් 6 කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම. |
| 08. | පෑස්සුම් ශිල්පී - Welder | 4 වැනි මට්ටම | අවු. 3 | |
| 09. | ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 2 වැනි මට්ටම | අවු. 1 | |
| 10. | විදුලි ශිල්පී - Electrician* | 3 වැනි මට්ටම | අවු. 2 | |
| 11. | ලෝහ පිරිසැකසුම් ශිල්පී - Metal Fabricator* | 3 වැනි මට්ටම | අවු. 2 | |
| 12. | ආවුද සහ අච්චු තැනුම් ශිල්පී - Tool & Die Maker | 4 වැනි මට්ටම | අවු. 3 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම හා යන්ත්‍රකරු පාඨමාලාවක් හදාරා තිබීම. |
| 13. | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී | 4 වැනි මට්ටම | අවු. 2 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම සහ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම. |
| 14. | පරිගණක යෙදවුම් සහායක | 3 වැනි මට්ටම | අවු. 1 | |
| 15. | යන්ත්‍රකරු (විශේෂ) - Machinist | අවු. 3 | අවු. 3 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම. |
| 16. | විදුලි කාර්මික (විශේෂ) | - | අවු. 3 | |
| 17. | ඉලෙක්ට්‍රොනික් කාර්මික (විශේෂ) | - | අවු. 3 | |
| 18. | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී සහ ත්‍රිමාන සජීව කරණය (Graphic Designing and 3D animation ) | - | අවු. 1 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම සහ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම සමග මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. |
| 19. | ඉදිකිරීම් සුපරීක්ෂක | - | අවු. 2 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම සහ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම. |

* අංක 10 සහ 11 යන පාඨමාලාවන් සඳහා අයදුම් කළ හැක්කේ 2009.01.01 දිනට වයස අවු. 16-25 අතර පුත්තලම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්ට පමණි.

වයස : 2009.01.01 වැනි දිනට වයස අවුරුදු 1 6 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

2. පුහුණුව පිළිබඳ විස්තර :

සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළදී ලබාදේ. එම කාලය තුළ මාසික දීමනාවක් ආධුනිකයාට ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

පෙදරේරු, කාර්මිල ශිල්පී, ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) හා පැස්සුම් ශිල්පි වැනි කාර්මික ශිල්පි සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත. පැස්සුම් ශිල්පී පාඨමාලාවේ දී පහත සඳහන් නවීන පැස්සුම් ශිල්පි ක්‍රම ද පුහුණු කරනු ලැබේ (MMS/GAS/TIG/MIG/MAG/PLASMA)

3. තෝරා ගැනීමේ ක්‍රමය :

3.1 සියළුම අයදුම්කරුවන් පැය 1ක් වූ ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. මේ සඳහා රු. 100ක මුදලක් අය කරනු ලබන අතර, මෙම ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා එහිදී ලබාගන්නා ලකුණු මත පාඨමාලාව තෝරා දෙනු ලැබේ. සියලුම පාඨමාලාවක් දේශීය/විදේශීය රැකියා අවස්ථා ඇති සම මට්ටමේ උසස් පාඨමාලාවන් බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

3.2 ඉහත සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් පාඨමාලාවට බඳවා ගනු ලැබේ.

4. අයදුම්පත් එවිය යුතු ආකාරය :

4.1 ඔබේ නම හා ලිපිනය ලියූ මුද්දර කවරයක් මෙම ආයතනයට එවීමෙන් හෝ ආයතනයට පැමිණීමෙන් හෝ ඉල්ලුම්පතක් ඔබට ලබා ගත හැකිය. නැතිනම් දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2 x 81/4 (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කල ඉල්ලුම් පතක් එවිය හැකිය. ඔබගේ ඉල්ලුම්පත සමග ලිපිනය සඳහා මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් 2008 ඔක්තෝබර් මස 20 වැනි දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට යොමුකළ යුතුය.

අධ්‍යක්ෂ/විදුහල්පති,
ආධුනිකත්ව අභ්‍යාස ආයතනය,
අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.

4.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

4.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය යටතේ පූර්ණ කලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

4.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස උඩ කෙළවර "ආධුනිකයන් බඳවා ගැනීම - 2009 ජනවාරි" යන්න සඳහන් කළ යුතුය.

5. තැපෑලේදී නැතිවන හා ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ආධුනිකත්ව අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

ආදර්ශ අයදුම් පත්‍රය 11 1/2" x 8 1/4"(A4 ප්‍රමාණයේ)

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

ආධුනිකත්ව බඳවා ගැනීම - 2009 ජනවාරි

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.(මයා/මිය/මෙනවිය)
2. මුලකුරු සමග නම :——————.
3. ලිපිනය :——————.
4. පදිංචිය :——————.
   (i) ග්‍රාමසේවා වසම :——————.
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
   (iii) ඡන්ද කොට්ඨාසය :——————.
   (iv) දිස්ත්‍රික්කය :——————.
5. දුරකථන අංකය :——————.
6. උපන් දිනය :——————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
8. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :——————.

අ. පො. ස. (සා/පෙළ) ප්‍රතිඵල

| විභාග අංකය | වර්ෂය |
|---|---|
| ................................ | ................................ |
| ................................ | ................................ |

| විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

9. ඔබගේ සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් අනුපිළිවෙලින් සඳහන් කරන්න

1. ——————.
2. ——————.
3. ——————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවට සහතික කරමි.

——————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික
පුහුණුකිරීම් අධිකාරිය.

09-911

### වාරිමාර්ග හා ජලකළමනාකරණ අමාත්‍යාංශය

වාරිමාර්ග කළමනාකරණ අංශයේ II වන ශ්‍රේණියේ ආයතන සංවර්ධන නිලධාරින් සඳහා වන I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008

වාරිමාර්ග කළමනාකරණ අංශයේ II වන ශ්‍රේණියේ ආයතන සංවර්ධන නිලධාරින් සඳහා වූ I වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2009 ජනවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.

2. I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි විභාග පරිපාටිය හා විෂය නිර්දේශය.

I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි විෂය නිර්දේශය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වේ.

(i) කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය - පැය 3 යි (විෂය අංකය 01) (මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 2 කින් සමන්විතය) - මුළු ලකුණු 100 යි.
එක් එක් කොටසින් අවම වශයෙන් ලකුණු 20 ක් වත් ලබාගත යුතුය.

(ii) රජයේ මුදල් රෙගුලාසි - පැය 03 යි (විෂය අංකය 02) මුළු ලකුණු 100 යි.

*සටහන :*

*(අ)* සියලුම විෂයන් සඳහා එකම වාරයකදී හෝ වාර කීපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට හැකිය.
*(ආ)* විභාගය සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකින් ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව ලකුණු 40 කි.

3. *විෂය නිර්දේශය:*
*(අ)* කාර්යාල පාරිපාලනය හා ආයතන සංග්‍රහය

I වැනි කොටස :

(1) වැටුප්
(2) අතිකාල දීමනා, නිවාඩු දින සහ නිවාඩු දින සඳහා වැටුප් හා දීමනා
(3) නිවාඩු
(4) දුම්රිය බලපත්‍ර
(5) දිවයින ඇතුළත රාජකාරි ගමන්, නිවාඩු ගමන්
(6) අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර
(7) නිල නිවාස
(8) වැටුප් ණය සහ අත්තිකාරම්
(9) ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග

II වැනි කොටස :

(10) කාර්යාල ක්‍රමවල වැදගත්කම්
(11) කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම
(12) ලිපිගොනුකරණය
(13) තැපැල් සම්බන්ධ කටයුතු
(14) ලිපිගොනුවල සටහන් ලිවීම

*(ආ)* මුදල් රෙගුලාසි :

(1) ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම
(2) වියදම් හා අත්හැර දැමීම් ආදිය
(3) ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්, ගණක නිලධාරින්, ආදායම් ගිණුම් නිලධාරින්,

ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම හා කාර්ය පැවරීම

(4) අග්‍රිම හා බැංකු ගිණුම්
(5) අත්තිකාරම් ගිණුම්
(6) සැපයුම් වැඩ හා සේවා
(7) විවිධ කරුණු (මු. රෙ 825 සිට 855 දක්වා සහ 875 සිට 893 දක්වා)

4. II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි විභාග පරිපාටිය හා විෂය නිර්දේශය

II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි විෂය නිර්දේශය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වේ.

(i) කළමනාකරණය හා සංවිධානය - කාලය පැය 3 යි (මුළු ලකුණු 100 යි)
(විෂය අංකය 03)
(ii) මහා වාරිමාර්ග ව්‍යාපාර කළමනාකරණය - කාලය පැය 3යි (මුළු ලකුණු 100 යි)
(විෂය අංකය 04)

*සටහන :*
*(අ)* මෙම විෂයයන් දෙක දෙවරකදී සමත්විය හැක.
*(ආ)* විභාගය සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකින් ලබාගත යුතු අවම ලකුණු සංඛ්‍යාව ලකුණු 40 කි.

විෂය නිර්දේශය :
*(අ)* කළමනාකරණය හා සංවිධානය:
(1) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ ඓතිහාසික විකාශනය
(2) සැළසුම් කිරීම, සංවිධානය කිරීම, මාණ්ඩලීකරණය
(3) අධීක්ෂණය, සංනිවේදනය හා පාලනය

*(ආ)* මහා වාරිමාර්ග ව්‍යාපාර කළමනාකරණය :

(1) ශ්‍රී ලංකාවේ වාරිමාර්ග කළමනාකරණයේ ඓතිහාසික විකාශනය
(2) සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය
(3) වාරිමාර්ග නීතිරීති, සම්ප්‍රදායයන් හා ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු
(4) ආයතනික සංවර්ධනය

*සැළකිය යුතුයි .-* අවශ්‍ය නම් මෙවර කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකම සඳහා එකවර පෙනී සිටිය හැකිය. එම තොරතුරු නිවැරදි ව ඇතුළත් කරමින් එක් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

5. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනයෙහි අවසානයෙහි පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් අයදුම්පත් පිළියෙලකර ගත යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පමණි. අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ

තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් සඳහන් කරමි.

පළමු වරට මෙම විභාගයන්ට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ගාස්තු ගෙවිය යුතු නොවේ. ඉන් පසු පෙනී සිටින වාර වලදී එක් විභාගයක් සඳහා සම්පූර්ණ විභාග ගාස්තුව රු. 250 ක් වන අතර, එක් විභාගයක එක් විෂයයක් සඳහා විභාග ගාස්තුව රු. 150 ක් වේ. තමන් පෙනී සිටින විෂයයන් සඳහා වන විභාග ගාස්තුව වාරි මාර්ග කළමනාකරණ අධ්‍යක්ෂගේ - ටොරිංටන් - ලංකා බැංකු ශාඛාවේ අංක 2323294 ගිණුමට බැර කරන ලෙස දැනුම් දෙන අතර, දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ අදාළ කොටුවෙහි නොගැලපෙන සේ ඇලවිය යුතුය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6. අයදුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය ඔක්තෝබර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ අයදුම්කරන විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාගය සඳහා වූ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. *අනන්‍යතාව* : විභාග දින විභාග ශාලාධිපති ඉදිරියේ අයදුම්කරු විසින් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේ පහත දැක්වෙන අනන්‍යතා පත්වලින් එකක් පමණි.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත

2. වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය)

8. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් කෙරේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

9. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයත් නිකුත් කර ඇති, තමන්ගේ දෙපාර්තමේන්තුවෙහි නිලධාරින්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ. විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැති අයෙකුට විභාගයට ඉදිරිපත්වීමට අවකාශ නොමැත.

10. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ඒ. පී. ආර්. ජයසිංහ,
අධ්‍යක්ෂ,
වාරිමාර්ග කළමණාකරණ අංශය.

**වාරිමාර්ග කළමනාකරණ අංශයේ II වන ශ්‍රේණියේ ආයතන සංවර්ධන නිලධාරින් සඳහා වූ I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2008**

First and Second efficiency Bar Examinations for Institutional Development officers of the Irrigation Management Division - 2008

ඉදිරිපත් වන විභාගය [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

I වන කඩඉම් විභාග - 1
II වන කඩඉම් විභාගය - 2
විභාග 2 ටම - 3

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) (සිංහල - 2/දෙමළ - 3)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම
(උදා:-SILVA, A. B.) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ඇ) මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. රාජකාරි ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.) :————.

ඉංග්‍රීසියෙන් :————.

සිංහලෙන්/දෙමළෙන් :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1, පුරුෂ -0) අදාළ අංකය කොටුව තුළ ලියන්න : [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

05. උපන් දිනය - වර්ෂය:———.මාසය:———. දිනය :———.

06. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවු. [ | ] මාස [ | ] දින [ | ]

07. පදවි නාමය :————.

08. ඉදිරිපත් වන විෂයය/ විෂයයන්

විෂය අංකය : ☐☐ විෂය :.................

විෂය අංකය : ☐☐ විෂය :.................

විෂය අංකය : ☐☐ විෂය :..................

විෂය අංකය : ☐☐ විෂය :.................

*ගැසට් පත්‍රයේ* දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය.

| |
|---|
| මෙම ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. |

කුවිතාන්සි අංකය.:—————.
ප්‍රදේශීය ලේකම් කාර්යාලය:—————.
දිනය:—————.
මුදල රු.:—————.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන

දිනය :—————.

ඉහත අත්සන් කර ඇති ............................................ මයා/මිය/මෙනවිය සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්,, ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය

දිනය : —————.

සැළකිය යුතුයි.- ශීර්ෂ අංක 01 සිට 07 තෙක් මුල් පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද ගන්න.

09-1016